ආයතනයේ නම : වැවිලි අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්
සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන්
ස්ථාවර නියෝග අංක 119(4) යටතේ
ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර
පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183

වැවිලි අමාත්‍යාංශය

පළමු කොටස : 95.00

	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	එම අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති පියවර / වර්තමාන තත්ත්වය
01.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	මේ වනවිට යාවත්කාලීන කර ඇති අතර එම ලේඛනය නඩත්තු කිරීම යථාවත් පරීදි ඉටු කරනු ලැබේ.
02.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිහ ණය ශේෂ පැවතුණි.	මේ වනවිට නිහ ණය ශේෂ වැඩි ප්‍රමාණයක් අවසන් කිරීමට කටයුතු කර ඇති අතර අනෙකුත් ඉතිරි ණය ශේෂ සම්බන්ධයෙන් ද නිරවුල් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

දෙවන කොටස : 81.00

	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	එම අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති පියවර / වර්තමාන තත්ත්වය
01.	2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ නියෝජිතයන් දෙදෙනා පිළිබඳ විස්තර MPI/PLN/06/SDG අංක දරණ 2019.10.28 දිනැති ලිපිය මඟින් තිරසර සංවර්ධන සභාව වෙත වාර්තා කර ඇත.
02.	විගණකාධිපතිවරයා විසින් ඡේද වලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	<u>ආදායම් ලැබීම්</u> මේ වනවිට නිවැරදි කිරීමට කටයුතු කර ඇත. <u>ආදායම් කළමනාකරණය</u> ප්‍රාදේශීය වැවිලි සමාගම් සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති කරුණු පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ප්‍රතිපත්තිමය තීරණ වලට එළඹීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. අනෙකුත් ඡේද වල ඇතුළත් කරුණු නිවැරදි කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී පෙන්වා දී ඇති පරිදි නිවැරදිව කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත.

ජානක ධර්මකීර්ති
ලේකම්

සකස් කළේ :- ජී.කේ.ජේ.කේ.රත්නසිරි

පරීක්ෂා කළේ :- ප්‍රධාන ගණකාධිකාරි

නිර්දේශ කළේ :- ප්‍රධාන මූල්‍ය නිලධාරි